# නිපුනතා04-01

## දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍ය අංකුරමය අවස්ථා හඳුනාගනිමු. (පහත රට සම්ප්‍රදාය)

ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ඉතිහාසය පිළිබඳ කතා කිරීමේ දී මූලික වශයෙන් සම්ප්‍රදායන් තුනකට බෙදා දැක්විය හැකිය.



1. → උඩ රට සම්ප්‍රදාය



2. → පහතරට සම්ප්‍රදාය



3. → සබරගමු සම්ප්‍රදාය

## උඩරට ශාන්ති කර්ම



1. කොහොඹාකංකාරිය
2. වලියක් මංගල්ලය
3. කඩවර කංකාරිය
4. 

ඉහත දක්වා ඇත්තේ උඩරට ශාන්තිකර්ම ආශ්‍රිත නාට්‍යමය ලක්ෂණ ඇතුලත් ශානතිකර්ම කිහිපයකි.

## ***පහත රට ශාන්ති කර්ම***



1. **දහඅට ශාන්ති කර්මය**
2. **රිද්දියාගය**
3. **සූනියම් යාගය**
4. **මහසොහොන් සමයම**

මේ අංග හතරම ඇත්තේ පහතරට  ශාන්තිකර්ම ආශ්‍රිත නාට්‍යමය  ලක්ෂණ ඇතුලත් ශානතිකර්ම ලෙසටය.

## ***සබරගමු  ශාන්ති කර්ම***



1. **ගම්මඩු ශාන්ති කර්ම**
2. **පූනාමඩු ශාන්තිකර්ම**
3. **මංගරමඩු ශාන්ති කර්ම**
4. **හැල්ලුම් මඩු හාන්තිකර්ම**
5. **කිරිමඩු ශාන්තිකර්ම**

**යනාදිය සබරගමු ශාන්තිකර්ම ලෙසත් ඒවාහි අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ ඇති බවටත් උදාරහරණ කිහිපයකි.**

**මේ ආකාරයට බලන කල දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය පිළිබඳව ඉලගන ගැනීමේදි මෙය ප්‍රධාන කොටස් තුනක් යටතේ අප විසින් අධ්‍යයනය කළ යුතු බව,**

අපේ පාඩමට අදාළ ප්‍රධාන අරමුණ වන්නේ , පහත රට ශාන්තිකර්ම සම්ප්‍රදාය තුළ අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ ඇතුලත්,

1. සන්නි යකුම හෙවත් දහඅට සන්නිය
2. රටයකුම හෙවත් රිද්දියාගය
3. සූනියම් යාගය හෙවත් වඩිගපටුන

යන ශාන්තිකර්ම පිළිවෙලින් ඒවාහි අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ හෙවත් නාට්‍යමය පෙළපාලි පිළිබඳ අධ්‍යයනයයි.

## *01. සන්නි යකුම හෙවත් දහඅට සන්නිය*



සන්නියකුම හෙවත් දහඅටසන්නිය හා පහතරට සම්ප්‍රදායේ අනෙකුත් ශාන්තිකර්ම සිදුකරන ප්‍රදේශ වශයෙන් .

බෙන්තර, මාතර, රයිගම, ගාල්ල, අම්බලන්ගොඩ, කළුතර, හම්බන්තොට

- *දහඅට සන්නිය පැවැත්වීමට හේතු,*

- වා, පිත්,සෙම්කම්පා වීම් නිසා සිදුවන සන්නි රෝග වලින් පුද්ගලයා මුදවා ගැනීම.
- මෙය පෞද්ගලික හෝ පොදු ශාන්තිකර්ම ලෙසට හඳුන්වා දියහැකිය.
- ඒ ඒ රෝග පදනම් කරගත් යක්ෂ වෙස් මුහුණු ලාංකීය වෙස් මුහුණු කලාවේ නිපුනතාවයන් පෙන්වා දෙයි.

මේ ආකාරයට බලන කල ශාන්තිකර්මය තුළ අන්තර්ගත නාට්‍යමය පෙළපාලි හෙවත් නාට්‍යමය අවස්ථා මොනවාදැයි විමසා බලමු.

**පළමුවෙන්ම :- පාලි පැමිණීම**

මෙය දොළහා පාලි නමින්ද හැදින්වේ. දොළහා පාලි යනු මොනවාද?

| | | |
|---|---|---|
| සළු පාලිය | කෙණ්ඩි පාලිය | තුවක්කු පාලිය |
| තැඹිලි පාලිය | දළු පාලිය | දුම්මල පාලිය |
| මුගුරු පාලිය | අතු පාලිය | කලස් පාලිය |
| පන්දම් පාලිය | අඟුරු පාලිය | කුකුල් පාලිය |

**දෙවනුව :- මහකෝල සන්නි යකාගේ කඩවත් තරණය**
**මෙම අංගයද නාට්‍යමය ලක්ෂන පෙන්නුම් කරයි.**

**තෙවනුව :-සූනියම් යක්ෂණියගේ පැමිණීම.** **මෙය සූනියම් යක්ෂණියගේ අවතාරය, අවස්ථා තුනක් යටතේ නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි.**

**එනම්,** →

01.රූමත් තරුණියක් ලෙස,

02.බඩදරු මවක් ලෙස,

03.දරුවා නළවමින් පැමිණෙන

**මෙම අවස්ථා ත්‍රිත්වය ද නාට්‍යමය ලක්ෂණ ඉතා ප්‍රබලව භාවිත කරන අවස්ථාවන් ලෙස පෙන්වා දිය හැකිය.**
**සිව්වනුව :- දහඅට සන්නිය පැමිණීම**

**https://youtu.be/g1vqjmWE57k**

**ඔබ මේ රූප පෙලෙන් දැක්කේ දහඅට සන්නියේ වෙස් මුහුණු කිහිපයකි.**
**මෙම වෙස්මුහුණු භාවිත කරමින් ඒ ඒ රෝග සඳහා වූ විවිධ අවස්ථාවන් ඉතා හාස්‍ය ජනක අයුරින් අනුකරණය, සමාරෝපය , අනුරූපනය ආදිය යොදා ගනිමින් ඉදිරිපත් කරනු ලබයි.**

***<u>දහඅට සන්නි වෙස් මුහුණු</u>***

| | | |
|---|---|---|
| මරු සන්නිය | කණ සන්නිය | වෙඩි සන්නිය |
| වාත සන්නිය | කොර සන්නිය | දේව සන්නිය |
| අමුක්කු සන්නිය | ගොළු සන්නිය | දෙමළ සන්නිය |
| ගුල්ම සන්නිය | නාග සන්නිය | වැදි සන්නිය |
| පිස්සු සන්නිය | බිහිරි සන්නිය | ගිලිජල් සන්නිය |
| ඝීත සන්නිය | භූත සන්නිය | කෝල සන්නිය |

**මේ ආකාරයට පහත රට ශාන්ති කර්ම වල එන දහඅට සන්නියේ නාට්‍යමය පෙලපාලි ලෙස ,**

- ✔ **පාලි පැමිණීම,**

- ✔ **මහකෝල සන්නියකාගේ කඩවත් තරණය,**
- ✔ **සූනියම් යක්ෂණියගේ අවතාර තුන**
- ✔ **සන්නියකුන් දහඅටදෙනාගේ පැමිණීම**

**යන අවස්ථාවන් පහතරට ශාන්තිකර්ම අතර නාට්‍යමය ලක්ෂණ වලින් ගහන ශාන්තිකර්ම ලෙස පෙන්වා දිය හැකිය.**

## ***<u>02. රට යකුම හෙවත් රිදදියාගය</u>***



**පහත රට ශාන්ති කර්මයන් හි නාට්‍යමය ලක්ෂණ ඇතුලත් තවත් එක් ශාන්තිකර්මයක් ලෙස මෙය පෙන්වා දිය හැකිය. මෙම ශාන්ති කර්මය පැවැත්වීමට හේතු මොනවාදැයි හඳුනා ගනිමු.**

- **විශේෂයෙන්ම කාන්තාවන් වෙනුවෙන් මෙම ශාන්ති කර්මය සිදුකරන නිසා , දරුවන් නැකි කාන්තාවන්ට දරුවන් ලබා දීම පිණිස මෙය පවත්වයි.**
- **කුඩා අවධියේ සිටින දරුවන්ගේ ආරක්ෂාව උදෙසා මෙම ශාන්ති කර්මය පැවැත්වීම ප්‍රධාන අරමුණ වේ.**

❖ **<u>මෙම ශාන්ති කර්මයේ විශේෂ ලක්ෂණ,</u>**

වෙස් මුහුණු භාවිත නොකරමින් පිරිමි ඇදුරෙකු විසින් කාන්තා චරිත නිරූපණයක් සිදු කිරීම.

රිද්දි බිසව් *<u>සත් කට්ටුව</u> හා කළු කුමාරයා ඇතුළු යකුන් පුදලැබීම.

↓

සපුමල් කුමාරී/ නාමල් කුමාරී
පිච්චමල් කුමාරී /කපුරුමල් කුමාරී
මදුමල් කුමාරී /ඉද්දමල් කුමාරී
කැකුළඵමල් කුමාරී

❖ <u>රටයකුම හෙවත් රිද්දියාගයේ අන්තර්ගත නාට්‍යමය පෙළ පාළි හඳුනාගනිමු.</u>









- ✔ නානුමුරය
- ✔ කපුයක්කාරිය
- ✔ දරුනැලවිල්ල

[https://youtu.be/BDA4JnFDLRY](https://youtu.be/BDA4JnFDLRY)

## *<u>නානුමුරය</u>*

❖ <u>මෙම පෙළපාලිය ඇතුලත් කතා පුවත නම්,</u>

**(කාන්තා වෙස් ගත් ඇදුරෙක් විසින් අපූර්ව ලෙස කාන්තා චරිතයක් මෙහි අනුකරණාත්මකව ඉදිරිපත්කරයි.)**

**කාන්තා වෙස් ගත් මෙම ඇදුරා හිස් සෝදා නා පිරිසිදු වී නොයෙක් ආකාරයෙන් සැරසීම, ( තෙල් ගෑම, අඳුන් ගෑම, හිස පීරීම, කොණ්ඩ කටු ගැසීම, කැඩපතෙන් මුහුණ බැලීම.... ආදි) නිරූපනය කරයි. මෙම නිරූපන ක්‍රියාවලිය තුළ සිද්ධ වන්නේ, උපත් කතාවේ එන *එදා රිද්දි බිසව නාමල් විලෙන් නා පිරිසිදු වූ අයුරු අනුකරණය කරන කළ බව කියැවේ.**

**මෙහි විශේෂයෙන් නාට්‍යමය ලක්ෂණ වලින් අනූන අවස්ථාවන් වන්නේ,**

- ➢ සංවාද භාවිතය
- ➢ අංග රචනය
- ➢ රංගභූමි හා රංග භාණ්ඩ භාවිතය
- ➢ කාන්තාවක් ලෙස සමාරෝපය
- ➢ භූමිකා නිරූපණය

**යන මේවා පෙන්වා දිය හැකිය.**

## කපුයක්කාරිය

❖ මෙම පෙළපාලිය ඇතුලත් කතා පුවත නම්,

උපත් කතාවට අනුව ,දීපන්කර බුදුන් සමයේ නොයිඳුල් සළුවක් වියා බුදුන්ට පිදීම සඳහා රිද්දි බිසවුන් විසින් කපුහේනක් කොටා, කපු හේනේ වපුරා, එය නෙලාගෙන සළුව වියීම මෙහිදී අනුකරණාත්මකව සිදුධ කරයි.

මෙහිදි රිද්දි බිසව් වෙනුවට පිරිමි ඇදුරෙක් කාන්තා වෙස් ගෙන මෙහි නාට්‍යමය පෙළපාලි කොටස් නිරූපණය කරයි. (රංගභාණ්ඩ, රංගවස්ත්‍ර, සංවාද, අනුරූපණය ආදිය මෙහි දැකිය හැකිය)

## දරුනැලවිල්ල

දරුනැල්විල්ල නම් කොටස උතුම් මාතෘත්වය පිළිබිඹු වන සේ කාන්තා වෙස් ගත් පිරිමි ඇදුරෙකු විසින් මවකගේ දාරක ස්නේහය හරි අපූරුවට පෙන්වන නාට්‍යමය ජවනිකාවකි. රංගභූමිය තුළ කවි ගායනා, සංවාද, අනුකරණය, අනුරූපනය, ආදිය භාවිත කරමින් භූමිකා නිරූපණය කිරීම විශේෂ ලක්ෂණයකි.

## 03.සුනියම් ශාන්තිකර්මය හෙවත් වඩිගපටුන




❖ මෙම පෙළපාලිය ඇතුලත් කතා පුවත නම්,
අතීතයේ මහා සම්මත රජුගේ ප්‍රිය බිරිඳ වූ මැණික් පාල බිසවට වසව කුමාරයා විසින් කරන ලදැයි කියැවෙන විනය කැපීම සඳහා වඩිග දේශයෙන් හසල බමුණන් පැමිණ මැණික්පාල දේවිය වෙනුවෙන් සිදු කළ ශානති කර්මය ලෙසට මෙහි මෙහි පුරාණෝක්තියේ හැදින්වෙයි.

❖ මෙම ශාන්ති කර්මයේ අරමුණු,

- **හදි හූනියම් ආදියෙන් අසනීප වූ ලෙඩුන් සුවපත් කිරීම ප්‍රමුඛ කරගත් ශාන්තිකර්මයකි.**
- **පෞද්ගලික අරමුණින් මෙන්ම පොදු මහජනතාව වෙනුවෙන් ද මෙම ශාන්ති කර්මය සිදුකරයි.**

❖ **<u>මෙම ශාන්තිකර්මයේ ඇතුලත් නාට්‍යමය පෙළපාලි හෙවත් නාට්‍යමය ලක්ෂණ,</u>**

- **වඩිගපුර දේශයෙන් පැමිණි බමුණකුගේ ස්වරූපයෙන් වෙස් ගැන්වීම. (මෙම වෙස් ගැන්වීම තුළින් )**

  **↓**

  **(රංගවස්ත්‍රාභරණ , අංගරචනය) වැනි අංග නාට්‍යමය ලක්ෂණ දරයි.**

- **විදේශීය පුද්ගල චරියක් නිරූපණය කිරීම , (බමුණු චරිතය)**

  **(මෙමඟින්)**

  **↓**

  **(සංවාද භාවිතය) ⟶ (හාස්‍යයෝත්පාදක දෙබස්, සංවාද) වෙනස් ආකාරයකින් ඉදිරිපත් කරයි.**

- **රංගභාණ්ඩ , කුතුහලය හා ගැටුම ආදී නාට්‍යමය ලක්ෂණ මෙහිදි යොදා ගනු ලබයි.**

**මේ ආකාරයට බලන කළ දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සැබෑදි නාට්‍ය අංකුරමය අවස්ථා අධ්‍යයනය කරමින් එහි ඇති නාට්‍යමය ලක්ෂණ නැතහොත් නාට්‍යමය පෙළපාලි හඳුනා ගත හැකිය.**

**මෙම පාඩමේ අපි අවධානය යොමු කළේ පහත රට ශාන්ති කර්ම වල අන්තර්තග නාට්‍යමය ලක්ෂණ ඇතුලත් ශාන්ති කර්ම වන ,**

1. **දහඅට ශාන්ති කර්මය**
2. **රිද්දියාගය**
3. **සූනියම් යාගය**

**යන අංග තුනටය.**

- ***<u>link</u>***
- **[https://youtu.be/g1vqjmWE57k](https://youtu.be/g1vqjmWE57k)**
- **[https://youtu.be/BDA4JnFDLRY](https://youtu.be/BDA4JnFDLRY)**

පැවරුම්:-

01. පහත රට ශාන්ති කර්ම වල නාට්‍යමය පෙළපාලි කිහිපයක් පිළිබඳ අධ්‍යයනය කර ඒවායේ දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ එකින් එක පැහැදිලි කරන්න.